
# යාච්ඤාවේ ගිවිසුම

## දරුවන් සඳහා



අපගේ මැවුම්කරුවූ විශ්වයේ දෙවියන්වහන්සේ , යාච්ඤාවට සවන් දී පිළිතුරු දෙයි. එය කෙතරම් පුදුම සහගතද? යේසුස් වහන්සේ පැවසුවේ “ස්වර්ගයේ හා පොළොවේ සියලු බලය මට දී තිබේ” කියායි. ඉතින් යේසුස් වහන්සේට සියලු බලය තිබේ නම්, ඔබ යාච්ඤා කළහොත් කුමක් සිදුවේදැයි ඔබට සිතාගත හැකිද...?

# කරුණාව

ආදරණීය ස්වර්ගික පියාණෙනි,
මට ආදරය කර මා ඔබේ දරුවෙකු
බවට පත් කිරීම ගැන ස්තුතියි.

දෙවියන් වහන්සේ සෑම කෙනෙකුම කොතරම් ප්රේනම කරනවාද යන්න පෙන්වාදීමට යේසුස්වහන්සේට  අවශ්යනය විය .එමනිසා උන්වහන්සේ නැතිවූ බැටළුවා ගැන කතාවක් කීවේය. එඬේරා තම නැතිවූ බැටළුවා ගැන බොහෝ කනස්සලු වූ අතර ඔහු අනෙක් බැටළුවන් අතහැර දමා නැතිවූ බැටළුවා සොයා ගියේ ඔහුට එම බැටළුවා ආරක්ෂාකාරීව තබා ගැනීමට අවශ්යත වූ නිසාය. බැටළුවන් යනු අසරණ සතුන් වන අතර සමහර විට ඔවුන් අතරමං වී තමන්ගේම මාර්ග වල යයි එවිට වලසුන්ට හෝ සිංහයන්ට උන්හට පහර දීමට හෝ ආහාරයට ගැනීමට හැකිය.

එඬේරාගේ කාර්යය වන්නේ බැටළුවන් අනතුරෙන් ආරක්ෂා කිරීමයි.ඔහු කලේ එයයි. නැතිවූ බැටළුවා සොයාගත් විට, ඔහු ඌව සතුටින් ගෙදර ගෙන යන අතර එය සැමරීමට විශාල සාදයක් පවත්වයි.




**කටපාඩම් පදය**

අපි දෙවියන්වහන්සේගේ දරුවෝයයි කියනු ලබන ලෙස පියාණන්වහන්සේ කෙබඳු ප්රේයමයක් අපට දී වදාළසේක්දැයි බලාපල්ලා. –1 යොහාන් 3 : 1

*යේසුස්වහන්සේ ඔබ ගැන ඉතා ප්රීති සන්තෝෂ වේ. උන්වහසේ තම ආදරයෙන් ඔබව සන්සුන් කරයි. උන්වහන්සේ ඔබ සැමග ගායනයෙන් ප්රීනති සන්තෝෂ වේ.*

# ආදරය

## ඔබට ආදරය කිරීමට සහ කීකරු වීමට මට උදව් කල මැනව.

ආබ්රතහම් දෙවියන්වහසේට කීකරු වුණා. ඔහු තම බිරිඳ සහ ඔවුන්ගේ බඩු බාහිරාදිය සමඟ පිටත් වී දුර බැහැර නව නිවසකට ගියේය. ආබ්රටහම්ගේ කීකරුකම, ප්රේඹමය සහ ඇදහිල්ල වර්ධනය කිරීමේ ඔහුගේ ජීවිතයේ ඔහු තැබූ මුල්ම නිර්භීත ක්රීයාවේ ආරම්භයයි.

ආබ්රආහම්
දෙවියන්වහන්සේට ප්රේපම කළා.
ඔහු ජීවත් වූයේ බොහෝ කලකට පෙරය.
ඔහු මහලු වූ විට දෙවියන් වහන්සේ කථා කර
“ඔබේ රට, ඔබේ පවුල සහ නෑදෑයන් අතහැර මා
ඔබට පෙන්වන දේශයට යන්න. මම ඔබට ආශීර්වාද
කර ඔබගේ පරම්පරාව මහත් ජාතියක් බවට පත්
කරමි. ඔබ ප්රශසිද්ධ වී අන් අයට ආශීර්වාදයක්
වනු ඇත. ඔබ නිසා පොළොවේ සිටින
සියල්ලන්ට ආශීර්වාද ලැබෙනු ඇත.”
යයි ප්ර කාශ කළා.




දෙවියන් වහන්සේට අවශ්ය වන්නේ අප
උන්වහන්සේට කීකරු වීමයි. අපි දෙවියන්
වහන්සේට කීකරුවීම තුලින් අපි
උන්වහන්සේට ප්රේ්මෙ කරන බව පෙන්වයි.

**කටපාඩම් පදය**

උන්වහන්සේ ඔහුට කථාකොට: තාගේ මුළු හෘදයෙන්ද තාගේ මුළු ආත්මයෙන්ද තාගේ මුළු බුද්ධියෙන්ද තාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේට ප්රේතමකරව. මේක උතුම්වූ පළමුවෙනිවූ ආඥාවය –මතෙව් 22 : 37,38

*එකට එක්ව යේසුස්වහන්සේට කීකරු වීම හා උන්වහන්සේ අනුගමනය කිරීම ඉතා ආකර්ෂණීය ගමනකි!*

# අනුකම්පාව

ඔබ මට ප්රේනම කරන ආකාරයට අන් අයට ප්රේ ම කිරීමට මට උදව් කල මැනව.




මිනිසෙකු පාරේ ගමන් කරමින් සිටියදී නරක මිනිසුන් කල්ලියක් විසින් ඔහුට පහර දෙන ලදී. ඔවුන් ඔහු සන්තක සියල්ල සොරකම් කර පාරේ මියයාමට දමා ගියහ. මිනිස්සු ඔහු පසුකර ගියත් ඔවුන් කිසිවෙකු ඔහුට අනුකම්පාව දැක්වූයේ නැත. එවිට සමාරිත ජාතිකයෙක් (මිනිසුන් පහත් කොට සලකන) ඔහු පාරේ වැටීසිටිනවා දැක ඔහුගේ තුවාල පිරිසිදු කර වෙළුම් පටියක් බැඳ සුවපත් කර ගැනීම සඳහා ආරක්ෂිත ස්ථානයකට ගෙන ගොස් ඔහුගේ රැකවරණය සඳහා මුදල් පවා ගෙවන ලදී.

යේසුස්වහන්සේ කතාව අවසන් කරමින්, “මට අවශ්‍යන වන්නේ ඔබත් ගොස් පිඩා විඳින අයටත් එසේ කිරීමයි.”

**කටපාඩම් පදය**

මාගේ ආඥාව නම් මා නුඹලාට ප්රේවමකළාක්මෙන් නුඹලාත් එකිනෙකාට ප්රේසමකරපල්ලාය යනුය. –යොහාන් 15 : 12

මට අවශ්‍ය ය මගේ වචනවලට පමණක් නොව, මගේ ක්රිනයාවෙන්ද ආදරය කිරීමටයි.

# පසුතැවිලි වීම

**මගේ පව් ගැන මට සමාවන්න. මාව පිරිසිදු කල මැනව.**

පේත්රැ ස් වරක් යේසුස්ගෙන් ඇසුවා, “අපට විරුද්ධව වැරදි කරන කෙනෙකුට අපි කිවතාවක් සමාවදියා යුතුද 7 වතාවක් දැයි ඇසීය?” “70 x 7” කියා යේසුස්වහන්සේ පැවසූ අතර උන්වහන්සේ තවත් කතාවක් කියන්න පටන්ගත්තා.

වරක් රජෙක් තම සේවකයන් තමාට ගෙවිය යුතු දේ ඔහුට පවසන ලෙස ඉල්ලා සිටියේය.එක් සේවකයෙකු විශාල මුදලක් ණය වී තිබූ අතර ඔහුට එය කිසි විටෙකත් ආපසු ගෙවීමට නොහැකිව තිබුණි. රජතුමා, “ඔබ මට ගෙවිය යුතු මුදල් ගෙවීම සඳහා මම ඔබ සහ ඔබේ පවුල වහලුන් ලෙස විකුණන්නෙමි !!” පැවසීය. මිනිසා හඬන්නට පටන් ගත්තා. රජුට අනුකම්පා සිතී, “ඔබ සියලු ණය වලින් නිදහස්ය!” කියා ඔහු සියල්ලෙන් නිදහස් කලාය.

නිදහස ලැබීමෙන් පසු ඔහු ගොස් තම සේවකයා සොයාගෙන ඔහු සුළු මුදලක් තමාට ණය වී ඇති අතර ඔහු එම මුදල් නොගෙවන්නේ නම් ඔහුව සිරගත කරන බවට තර්ජනය කළේය. සේවකයා දයාව ඉල්ලා සිටියද ඔහුට අනුකම්පාවක් නොතිබූ අතර ඔහු ඒම සේවකයා සිරගත කළේය.




රජතුමා ඒ බව දැනගත් විට ඉතා කෝප වී කෑගසමින්, “දුෂ්ට සේවකයා! මම ඔබේ විශාල ණය ප්රැමාණයට ඔබට සමාව දුන්නා, ඇයි ඔබ ඔබේ සේවකයාට අනුකම්පා නොකළේ? ” රජ ඔහුව සිරගෙට විසි කළේය

*යේසුස්වහන්සේ මට සමාව දෙන නිසා මටද අන් අයට සමාව දීමට අවශ්ය ය.*

**කටපාඩම් පදය**

මාගේ අයුතුකමින් මා සම්පූර්ණයෙන්ම සේදුව මැනව, මාගේ පාපයෙන් මා පිරිසිදුකළ මැනව.–ගීතාවලිය 51 : 251:2

# නමස්කාරය

## මම මුළු හදවතින්ම ඔබට ප්‍ර ශංසා කරන්නෙමි!

යේසුස්වහන්සේ ඉපදෙන විට හැමෝම සතුටින් සිටියා! දේවදූතයන් පැමිණ, "ස්වර්ගයේ දෙවියන් වහන්සේට ප්‍රාශංසා කරන්න! දෙවියන්වහන්සේ සතුටු කරන සැමට මිහිපිට සාමය." ළදරු යේසුස්ව බැහැදැකීමට එඬේරුන් පැමිණියා.




මීට වසර 2000 කට පමණ පෙර, මරියා නම් තරුණිය බැහැදැකීමට ගාබ්රිබයෙල් නම් දේවදූතයෙක් පැමිණියා. ඔහු විශේෂ පණිවිඩයක් රැගෙන ආවා "මරියා, බිය නොවන්න.මක්නිසාද නුඹට දෙවියන්වහන්සේගේන් කරුණාව ලැබුනේය. ඔබ පුතෙක බිහි කරන්නේය ඔහුගේ නම යේසුස් ලෙස හඳුන්වනු ඇත. ඔහු ශ්‍රේ.ෂ්ඨ , මහෝත්තමයාණන්ගේ පුත්‍ර යා යයි කියනු ලැබේ." යයි පැවසිය.

### කටපාඩම් පදය

ස්වාමීන්ට මාගේ මුළු සිතින් ස්තුති කරන්නෙමි;
ඔබගේ ආශ්චර්ය ක්‍රිණයා සියල්ල දක්වා
දෙන්නෙමි. –ගීතාවලිය 9 : 1

මරියතුමිය, යෝසෙප්, එඬේරුන් සහ ශාස්ත්‍රවන්තයන් යේසුස්වහන්සේට ගෞරව කොට නමස්කාර කළාක් මෙන්, අපිත් උන්වහන්සේට ගෞරව කර නමස්කාර කළ යුතුයි.

*මට හැමදාම ඔබට ප්‍ර ශංසා කිරීමට අවශ්‍යයි!*

# කැපවීම

ජේසුනි, මාගේ ස්වාමීන් ලෙස ඔබව අනුගමනය කිරීමට මට අවශ්‍ය ය. ඔබට අවශ්‍ය ඕනෑම ආකාරයකින් මාව වෙනස් කල මැනව.

හදිසියේම පේත්‍රැතස්ට යේසුස්වහන්සේගේ වචන මතක් වූ අතර ඔහු හඬමින් පලා ගියේය.ඔහුට භීතියක් දැනුනි. නමුත් යේසුස්වහන්සේ පේත්‍රැ ස්ව අත්හැරියේ නැහැ. යේසුස්වහන්සේ නැවත නැඟිටීමෙන් පසු පේත්‍රේස් සමඟ උදේ ආහාරය ගත් අතර ඔහුට සමාව දුන්නේය. යේසුස්වහන්සේට අවශ්‍යි වූයේ පේත්‍රැස් තම ගෝලයා වී තවත් ගෝලයන් බිහිකිරීමයි. පේත්‍රැයස් පරිපූර්ණ නොවූවත්, පේත්‍රැයස් තමන් ස්වාමීන් ලෙස අනුගමනය කිරීමට කැමති බව යේසුස් දැන සිටියේය.




**කටපාඩම් පදය**

උන්වහන්සේ සියල්ලන්ට කථාකොට: යමෙක් මා පස්සේ එන්ට කැමති නම්, ඔහු තමාගේම ආශා වලකාගෙන, දවස්පතා තමාගේ කුරුසිය රැගෙන, මා අනුව ඒවා. –ලූක් 9 : 23

*ජේසුනි, මට නිතරම ඔබට පක්ෂපාත වීමට අවශ්‍යයසය.*

# යැපීම

ඔබගේ ශුද්ධාත්මයාණන්ගෙන් මාව පුරවන්න. මා වෙනුවෙන් ඇති ඔබගේ සැලසුම් දැන ගැනීමට මට අවශ්‍යය.

සභාවන්හි සේවය ආරම්භ කිරීමට යේසුස්වහන්සේ තම ආත්මය එව්සේක. වැඩි කාලයක් යන්නට මත්තෙන්, පෙන්තකොස්ත දිනය නමින් හැඳින්වෙන විශේෂ දිනයක,තද සුළඟක් හමන අතර, උන්වහන්සේ ශුද්ධාත්මයාණන්ගෙන් සියල්ලන් පූර්ණ කරන ලදී.




උන්වහන්සේගේ ආත්මයාණන් වහන්සේ අපගේ සැනසිලිකරුවානන් ලෙස සැමවිටම අප සමඟ සිටින අතර, අපේ ගුරුවරයා සහ අපගේ මාර්ගෝපදේශකයාද වේ..

**කටපාඩම් පදය**

නුමුත් ආත්මයාණන්ගෙන් පූර්ණවී. –එපීස 5 18 b

*ජේසුනි, ඔබගේ ශුද්ධාත්මයාණන්ගෙන් මා පුරවා මාව ඔබ හා සමාන කරන්න.*

# බලපෑම

## මාව ඔබගේ කරුණාව, සත්‍යළය සහ යුක්තිය පිළිබඳ පණිවිඩකරුවෙකු කල මැනව.

යේසුස්වහන්සේට යුක්තිය උදෙසා හදවතක් තිබුණි.ළමයින්ට හිංසා කරන ඕනෑම කෙනෙකුට එය දරුණු වනු ඇතැයි උන්වහන්සේ පැවසීය.උන්වහන්සේ සෑම විටම බොහෝ දෙනා නොසලකා හැරිය තරුණ, රෝගී සහ දුප්පතුන් හට උදව් කරමින් සිටියේය.




දිනක් ගෝලයන් යේසුස්වහන්සේගෙන් ඇසුවා, “ස්වර්ග රාජ්ය”යේ ශ්රේෂ්ඨතම තැනැත්තා කවුද? කියා ” ඔවුන් සිතන දේ යේසුස්වහන්සේ දැන උන්වහන්සේ කුඩා දරුවෙකු කැඳෙව්වා.උන්වහන්සේ තම ගෝලයන් දෙස බලා පුදුම සහගත දෙයක් පැවසිය. “මේ දරුවා මෙන් යටහත් පහත් වන තැනැත්තා ස්වර්ග රාජ්ය යේ ශ්රේගෂ්ඨතම තැනැත්තාය.”

යේසුස්වහන්සේ ඊටත් වඩා පුදුම දෙයක් පැවසුවා. “තවද යමෙක් මාගේ නාමින් මෙබඳු කුඩා දරුවෙකු පිළිගන්නේද ඔහු මා පිළිගන්නේය”. ඔබ දන්නවා යේසුස්වහන්සේ මෙසේ අදහස් කලේ උන්වහන්සේ සත්යගය පමණක් කතා කළ නිසාය.

### කටපාඩම් පදය

තවද වාක්යජයාණෝ මාංසවත්වී, කරුණාවෙන්ද සත්යායෙන්ද පූර්ණව, අප අතරෙහි වාසයකළසේක. –යොහාන් 1 : 14

*මම උත්සාහ කර සෑම විටම සත්‍යළය ප්‍රකාශ කරමි.*

# ගෝලත්වය

ඔබව මහිමයට කරන්න සහ ඔබව අනුගමනය කිරීමට අන් අයට ආරාධනා කරන්න මාව පාවිච්චි කල මැනව.

දිනක් සාවුල් (ඔහුගේ නම පාවුල් ලෙස වෙනස් වීමට පෙර) පාරේ ඇවිදිමින් සිටියේය. හදිසියේම අහසින් ඉතා දීප්තිමත් ආලෝකයක් දිස්වී ඔහු බිම ඇද වැටුණි. ඒ ආලෝකය ඔහුව අන්ධ කළේය. එවිට සාවුල්ට “සාවුල්, ඔබ මට පීඩා කරන්නේ මන්ද ” කියා හඬක් ඇසුණි. සාවුල්, “ස්වාමීනී ඔබ කවුද? “මම ඔබට පීඩා කරන යේසුස්.” පාවුල් බියෙන් කම්පා විය. දවස් තුනක් ඔහුට ඇස් නොපෙනුණි.




පාවුල් තුමා බයිබලයේ ඉතා වැදගත් පුද්ගලයෙකි. ඔහු අළුත් ගිවිසුමේ බොහෝ පොත් ලිවීය. නමුත් පාවුල් වරෙක ක්‍රිතස්තුස් වහන්සේගේ වෛරකල සතුරෙක් විය. ඔහු ක්‍රිපස්තුස්ගේ අනුගාමිකයන් මරා දැමීය. නමුත් යේසුස්වහන්සේ ඔහුව වෙනස් කළා.

දෙවියන්වහන්සේ සාවුල්ව සුව කළ අතර ඔහු ගිය සෑම තැනකම යේසුස්වහන්සේ ගැන දේශනා කිරීමට හා ඉගැන්වීමට පටන්ගත්තේය.පසු කලෙක සාවුල්ගේ නම පාවුල් ලෙස වෙනස් කරන ලදි. ඔහු යේසුස්වහන්සේ වෙනුවෙන් ලෝකය උඩු යටිකුරු කළේය, දෙවියන් වහන්සේට සියලු මහිමය ලබා දෙමින් අන් අයටත් එසේ කිරීමට ඉගැන්වීය.

## කටපාඩම් පදය

එබැවින් නුඹලා ගොස්, සියලු ජාතීන් ගෝලයන් කරපල්ලා, පියාණන්ගෙත් පුත්‍රායාණන්ගෙත් ශුද්ධාත්මයාණන්ගෙත් නාමයට* (* නාමය තුළට ඔවුන් බව්තීස්මකරපල්ලා. අවගාහනයකරපල්ලා). –මතෙව් 28 : 19

*යේසුස්වහන්සේව අනුගමනය කිරීමට මට ආරාධනා කළ හැක්කේ කාටද?*

# අධිකාරිය

යේසුස් වහන්සේගේ නාමයෙන් යාච්ඤා කරමි. ආමෙන්.

බාර්තිමියුස් අන්ධ මනුෂ්‍යයෙක් විය.ඔහු වීදිවල ජීවත් වූ හිඟන්නෙකි.ඔහු යේසුස්වහන්සේ ගැනත් උන්වහන්සේගේ පුදුම ක්‍රියා ගැනත් දැන සිටියේය.යේසුස්වහන්සේ ලෙඩුන්, අන්ධයන් ඇවිදින්නට බැරි අය සුව කළ හැටි ඔහුට ඇසුනි.බාර්තිමියුස්ට වුවමනා වූයේ යේසුස්වහන්සේ ඔහුවද සුව කිරීමයි.

“ජේසුනි, ස්වාමීනි, මට අනුකම්පා කරන්න!” බාර්තිමියුස් කෑගැසුවේය.

බාර්තිමියුස් අවට ජනයා අකාරුණික විය.“ඔහ් නිශ්ශබ්ද වන්න!” ඔවුහු කෑ ගැසූහ. නමුත් බාර්තිමියුස් දිගින් දිගටම කෑගැසුවේය.යේසුස්වහන්සේ ඔහුට ඇහුම්කන් දී “මා වෙතට ගෙනෙන්න” කියා කීවේය. බාර්තිමියුස් තම සළුව බිම දමා යේසුස්වහන්සේ වෙතට දිව ගියේය. “ඔබට අවශ්‍යත කුමක් ද?” යේසුස්වහන්සේ ඇසුවේය. බාර්තිමියුස් පිළිතුරු දුන්නේ, “මට පෙනීම අවශ්‍යයියි!”




මිනිසුන්ව සුව කිරීමට යේසුස්වහන්සේට බලය තිබෙන බව බාර්තිමියුස් විශ්වාස කළේය. ඔහු මුලින්ම යේසුස්වහන්සේගේ මුහුණ දුටු විට ඔහු කොතරම් සතුටු වූවාද කියා ඔබට සිතාගත හැකිද?.

*බාර්තිමියුස් තමාට මොරගැසූ විට යේසුස්වහන්සේ පිළිතුරු දුන්නේය. යේසුස්වහන්සේ ඔබටද පිළිතුරු දෙයි.*

## කටපාඩම් පදය

එබැවින් දෙවියන්වහන්සේ උන්වහන්සේව ඉතා උසස්කොට, සියලු නාමවලට වඩා උසස් නාමය උන්වහන්සේට දුන්සේක. –පිලිප්පි 2 : 9

## ක්‍රිතයාකාරකම් පියවර

1. යාච්ඤාවේ ගිවිසුම සමාලෝචනය කරන්න
2. දින 40 ක් පුරා යාච්ඤාවේ ගිවිසුම යාච්ඤාකරන්න
3. යාච්ඤාබයිබල් පද කටපාඩම් කරන්න
4. හරි හෝ වැරදි රවුම් කර පිළිතුරු සාකච්ඡා කරන්න

| | |
|---|---|
| දෙවියන්වහන්සේගේ කරුණාව නිසා මාව උන්වහන්සේගේ ආදරණීය දරුවකු බවට පත් කර ඇත්තෙමි. | හරි වැරදි |
| ආශීර්වාදය කීකරුකම අනුගමනය කරයි. | හරි වැරදි |
| අප ආදරය කළ යුත්තේ අපට ආදරය කරන අයට පමණි. | හරි වැරදි |
| යේසුස්වහන්සේට අවශ්‍යප වන්නේ අප අන් අයට සමාව දී අමනාප නොවී සිටීමයි. | හරි වැරදි |
| අප දෙවියන් වහන්සේට ප්රnශංසා කළ යුත්තේ අප සතුටින් සිටින විට පමණි. | හරි වැරදි |
| අපි යේසුස්වහන්සේව අනුගමනය කිරීමට කැප වූ විට, උන්වහන්සේ අපව තව තවත් උන්වහන්සේ හා සමාන කරයි. | හරි වැරදි |
| ශුද්ධාත්මයාණන් වහන්සේ අපගේ මඟ පෙන්වන්නා ය. | හරි වැරදි |
| යේසුස්වහන්සේට දරුවන් හට වෙලාවක් තිබුණේ නැත. | හරි වැරදි |
| දෙවියන්වහන්සේ යේසුස්වහන්සේ ගැන අන් අයට පැවසීමට වැඩිහිටියන් පමණක් යොදා ගනී. | හරි වැරදි |
| ස්වර්ගයේ හා පොළොවේ ඇති සියලු බලය අයිති දෙවියන්වහන්සේට ය. | හරි වැරදි |
| යාච්ඤාව බලයයි මන්ද, ජේසුස්වහන්සේගේ නාමයේ බලය ඇත. | හරි වැරදි |
| මම යාච්ඤා කරන විට දෙවියන්වහන්සේ මට සවන් දෙයි. | හරි වැරදි |



# යාච්ඤා කරන්නේ කෙසේද? යාච්ඤාවේ ගිවිසුම දරුවන් සඳහා

**1 වන පියවර** සෑම දිනකම ඔබ විසින්ම මෙම යාච්ඤාවන් දින 10 ක් යාච්ඤාව යාච්ඤා කරන්න.

**2 වන පියවර** ඔබ මෙම යාච්ඤාවන් යාච්ඤා කරන විට, ඔබ විසින් කා හට මෙම යාච්ඤාවේ ගිවිසුමට එක්වන ලෙස ආරාධනා කලයුතු දැයි ඔබට පෙන්වන ලෙස යේසුස්වහන්සේගෙන් ඉල්ලන්න.

**3 වන පියවර** ඔබ ඔබේ මිතුරා වෙනුවෙන් දින 40 ක් යාච්ඤා කල ආකාරයට ඔබ වෙනුවෙන් දින 40 ක් යාච්ඤා කිරීමට එම පුද්ගලයාට ආරාධනා කරන්න. ඔහු/ඇය ඔබේ මිතුරා, අම්මා, තාත්තා, සහෝදරිය, සහෝදරයා, ආච්චි සීයා, ගුරුවරයා හෝ දේවගැතිවරයා විය හැකිය.

**4 වන පියවර** දෙවියන්වහන්සේ ඔබේ යාච්ඤාවලට පිළිතුරු දුන් ආකාරය ඔබේ යාච්ඤා සහකරු/සහකාරිය සමග බෙදාගන්න.එය ඔබට ලිවීමට හෝ චිත්‍ර යකින් ඇඳීමට හැකිය.

**5 වන පියවර** දී ඇති බයිබල් පද කටපාඩම් කරන්න.

**6 වන පියවර** යේසුස්වහන්සේගේ ශුභාරංචිය අන් අය සමඟ බෙදාගන්න.

**7 වන පියවර** ඉහත පියවරයන් නව යාච්ඤා හවුල්කරුවන් සමඟ නැවත කරන්න, එවිට ඔබට ඔවුන් හා එක්ව යේසුස්වහන්සේව අනුගමනය කළ හැකිය.

මගේ නම:

______________________________

අද මම දරුවන් වෙනුවෙන් යාච්ඤාවේ ගිවිසුම යාච්ඤා කරන්න පටන්ගත්තා.

අද දිනය: ______________________

**මගේ යාච්ඤාවේ ගිවිසුම් හවුල්කරුවන්**

| | |
|---|---|
| නම | දිනය |
| නම | දිනය |
| නම | දිනය |

# යාච්ඤාවේ ගිවිසුම දරුවන් සඳහා

**කරුණාව** ආදරණීය ස්වර්ගික පියාණෙනි, මට ආදරය කර මා ඔබේ දරුවෙකු බවට පත් කිරීම ගැන ස්තූතියි.

**ආදරය** ඔබට ආදරය කිරීමට සහ කීකරු වීමට මට උදව් කරන්න.

**අනුකම්පාව** ඔබ මට ආදරය කරන ආකාරයට අන් අයට ප්රේමම කිරීමට මට උදව් කරන්න.

**පසුතැවිලි වීම** මගේ පව් ගැන මට කණගාටුයි. මාව පිරිසිදු කරන්න.

**නමස්කාරය** මම මුළු හදවතින්ම ඔබට ප්ර්ශංසා කරන්නෙමි!

**කැපවීම** ජේසුනි, මාගේ ස්වාමීන් ලෙස ඔබව අනුගමනය කිරීමට මට අවශ්ය ය. ඔබට අවශ්ය  ඕනෑම ආකාරයකින් මාව වෙනස් කරන්න.

**යැපීම** ඔබගේ ශුද්ධාත්මයාණන්ගෙන් මා පුරවන්න. මා වෙනුවෙන් ඔබගේ සැලසුම් දැන ගැනීමට මට අවශ්යශය.

**බලපෑම** මාව ඔබගේ කරුණාව, සත්යසය සහ යුක්තිය පිළිබඳ පණිවිඩකරුවෙකු කරන්න.

**ගෝලත්වය** ඔබේ ඔබව අනුගමනය කිරීමට අන් අයට ආරාධනා කරන්න හා ඔබගේ මහිමය සඳහා මා භාවිතා කරන්න.

**අධිකාරිය** යේසුස්වහන්සේගේ නාමයෙන් මම යාච්ඤා කරමි. ආමෙන්.

ප්රිකාශන හිමිකම © 2016 කැන්ඩි මාබාලි විසිනි. සියලුම හිමිකම් ඇවිරිණි. නිදර්ශන ලූක් ෆ්ලවර්ස් විසින්. ළමුන් සඳහා වූ යාච්ඤාවේ ගිවිසුම අනුවර්තනය කරන ලද්දේ කැන්ඩි මාබාලි සහ ස්ටීවන් අයර් ගේ ළමයින් සඳහා වූ යාච්ඤාවේ ගිවිසුමේ බලය,

theprayercovenant.org/children